# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1996 අංක 7 දරන
## සුරාබදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 මාර්තු මස 25 වන දින]

(ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.)

---

1996 මාර්තු මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : ශත 45 යි.　　　තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

## 1996 අංක 7 දරන සුරාබදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 මාර්තු මස 25 වන දින.]

එල්. ඩී.—ඕ. 27/95

### සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1996 අංක 7 දරන සුරාබදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන සුරාබදු ආඥාපනතේ 15 වන වගන්තියේ (ඇ) ඡේදයේ "බෑවරියක් හෝ ගුදමක්" යන වචන වෙනුවට "බෑවරියක්, මත්පැන් නිෂ්පාදනාගාරයක් හෝ ගුදමක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

52 වන අධිකාරය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) එහි (අ) ඡේදයේ "ඉස්කාගාර සහ බෑවරි" යන වචන වෙනුවට "ඉස්කාගාර, බෑවරි සහ මත්පැන් නිෂ්පාදනාගාර" යන වචන ආදේශ කිරීමෙන්,

(ආ) එහි (ඇ) ඡේදයේ "බෑවරියක් හෝ ගුදමක්" යන වචන වෙනුවට "බෑවරියක්, මත්පැන් නිෂ්පාදනාගාරයක් හෝ ගුදමක්" යන වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "බෑවරියක් හෝ ගුදමක්" යන වචන වෙනුවට "බෑවරියක්, මත්පැන් නිෂ්පාදනාගාරයක් හෝ ගුදමක්" යන වචන ආදේශ කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "ඉස්කාගාරයක හෝ බෑවරියක" යන වචන වෙනුවට "ඉස්කාගාරයක, බෑවරියක හෝ මත්පැන් නිෂ්පාදනාගාරයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (ඇ) ඡේදයේ (i) අනුඡේදයේ "ඉස්කාගාරයේ හෝ බෑවරියේ" යන වචන වෙනුවට "ඉස්කාගාරයේ, බෑවරියේ හෝ මත්පැන් නිෂ්පාදනාගාරයේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (ඉ) ඡේදයේ " බෘෘවරියක් හෝ ගුදමක් " යන වචන වෙනුවට " බෘෘවරියක්, මත් පැන් නිෂ්පාදනාගාරයක් හෝ ගුදමක් " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.